**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ජූනි මස 04 වන දින සිට ජූනි මස 12 වන දින දක්වා**

**ගින්න දැනටම ඇවිලී ඇත්නම් කොපමණ හොඳද?**

01. ආරම්භක ප්‍රශංසාව:

පුබුදු ගී අංක 11 "සුදතුම් මඟුලයි...."

**"අයදින සියල්ලන්ට ළංව සිටින, අවංක සිතින් යදින්නන්ට ආසන්නව සිටින දෙවිතුමාණෝ දයාවන්තය. අනුකම්පාවෙන් පූර්ණය. වහා නොකිපෙන සුලුය. තිරසර පෙමින් යුතුය. වැටෙන දුබලුන් හට ආධාර කරන සේක. නැමී සිටින සියල්ලන් කෙලින් සිටුවන සේක."** දේව ප්‍රේමයේ මහා බලය මුළු විශ්වය හා බෙදා ගත් දෙවි මහෝත්තමයාණෝ අසීමිත ලෙස මිනිසාට ප්‍රේම කරන බව ඉහත වගන්ති තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට මට පසක් කර දෙයි. එවන් ප්‍රේමණීය අත්දැකීමක් භුක්ති විඳින්නට වරම් ලැබූවන් ලෙස අපි මහෝත්තම දෙවි සමිඳාණන් පසසමු. පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ...."

02. ආපසු බැලීම :

i සාංඝික පවුල් දින සුපුවත හරහා අපව අවදි කරන ලද සුභාරංචියට, දේව සිත විමසන්නට දේව වචනය ගෙනයන්නට ඔබට හැකිවීද?

ii දේව සිත විමසීමේදී වචනය භාර ගන්නට, දේව කැමැත්ත මා තුළ සිදුවන තුරු බලා සිටින්නට තරම් මගේ විශ්වාසයේ ජීවිතය පොහොසත්ද?

iii මේ වසර පුරා වචනය සෙවීමට, දේව කැමැත්ත ඉටු කිරීමට ගතහැකි පියවරයන් ගැන සාකච්ඡා කළ ඔබට ඉන් එකක් හෝ ක්‍රියාත්මක කරන්නට පටන්ගත හැකිවීද?

03. දවසේ සුපුවත :

ශුද්ධාත්ම මංගල මහෝත්සවයේදී වසරේ තේමාව තුළ ජීවත් වන්නට බලගතු ආශිර්වාදයක් අප සැමට ලැබිණි. තේමාව ප්‍රකාශ වූ අයුරු, තේමාවේ අන්තර්ගතය මනා ලෙස අවබෝධ කරගත් අපි ජීවත්වීමේ ගමනකට ඇතුළු වී සිටිමු. අද දවසේදී ද දෙවියන් වහන්සේගේ වචනය ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ ගින්නක් ලෙස ඇවිළුණු අත්දැකීමට අපි ඇතුළු වෙමු

**ගින්න දැනටම ඇවිලී ඇත්නම් කොපමණ හොඳද?**

* සමිඳාණන් වහන්සේ කථා කරන ගින්න මොකද්ද?
* ඔවුන් වහන්සේ තුළ ඇවිළුණු ගින්න සියල්ලන් දවාලන, සුණු විසුණු කරන ගින්නක් ද?
* විනාශයේ ගින්නක් ද? නැතහොත් අන් අය දල්වන ගින්නක් ද?

සමිඳාණන් වහන්සේ පවසන වචනය අපේ මනුෂ්‍ය බුද්ධියෙන් නම් තේරුම්ගත නොහැකිය. බුද්ධිගෝචර නොවී ශුද්ධාත්ම ගෝචර වුවහොත් එය තේරුම් ගන්නට අපට හැකිවේ. සමිඳාණන් වහන්සේ තුළ හටගත් ගින්න නම් පුත්‍රභාවයට සාක්ෂි දැරීමේ, දේව කැමැත්ත ඉටු කිරීමේ පිපාසයෙන් ඇවිළුණු ගින්නයි. ජෝර්දාන් නදියේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ස්නාපනය සමඟ ඔවුන් වහන්සේ තුළ එම ගින්න අවුළුවාලූයේ ශුද්ධාත්මයාණන් වහන්සේ විසිනි. එතැනින් ඔවුන් වහන්සේව පාළුකරයට රැගෙන ගිය ආත්මයාණන් වහන්සේ ඔවුන් වහන්සේගේ සමස්ත ජීවිතය පුරා මඟපෙන්වන්නානන් විය. ශුද්ධාත්ම ගුරු දේවයාණන්ගේ මඟපෙන්වීමට හා මෙහෙයවීමට කීකරු වීම, යටහත් වීම ජේසු සමිඳාණන් වහන්සේගේ ජීවිත රිද්මය විය. ඔවුන් වහන්සේගේ ජීවිතයේ කුරුසියේ මරණය දක්වාම ඇවිළුණු ගින්න උත්ථානය කරා රැගෙන ගියා. ඔවුන් වහන්සේගේ මරණය, උත්ථානය සිදුවුනේ නැත්නම් පොළව ගිනිලන්නට ආවාවූ තැනැන් වහන්සේ ලෙස ඒ කාර්යය කරන්නට බැහැ. මරණයෙන් උත්ථාන වී ශුද්ධාත්මයාණන්ව තෑගි කරන්න මේ ගින්න ඔවුන් වහන්සේව අවුලනු ලැබුවා. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ගින්නෙන් ඇවිළුණු පුද්ගලයාට නිකන් ඉන්නට බැරි බව අපට ඉතා පැහැදිලිය.

* මේ ගින්නට හසුවුනු ස්වාමින් වහන්සේ මුළු විශ්වයටම අළුත් ජීවිතයක් දුන්නා. අපව නව මැවිල්ලක් බවට කළා.
* මේ ගින්නට හසුවුනු ස්වාමි තාත්තා මේ ලක් දේශය පුරාම ඒ ගින්න අවුළුවන්නෙක් බවට පත් වුනා. දස දහස් ගණනක් ජීවිත සමිඳාණන් වහන්සේට දිනා දුන්නා.

04. සාකච්ඡාව සඳහා : (ළඟ සිටින කෙනෙකු සමඟ)

i ඔබ මා තුළ මේ ගින්න ඇවිලී ඇතිද?

ii ගින්නෙන් ඇවිළුණු කෙනෙකු ලෙස අන් අයවද අවුළුවන්නට මා ගෙන ඇති පියවර කුමක්ද?
iii මට ගත හැකි පියවරන් ගැන බෙදා ගන්න.
iv ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීම හා ශුද්ධාත්මයාණන් හා සබැඳියාවෙන් යුතු අවදිවීමේ ජීවිතයකට මිනිසුන් උනන්දු කරවන්න.

05. අවසන් ප්‍රශංසාව:
ශුද්ධාත්ම ගින්නෙන් අප සැම අවුළුවන්නැයි යදිමින් ළඟ සිටින කෙනෙකු ස්පර්ශ කොට ශුද්ධාත්ම ස්නාපනය පතා යාච්ඤා කරමු.

"සුදත් ගින්නෙන් දැවෙමු දැන්...."

***************